# පුංචි අහිංසා



සාවිකා නෙතුෂි විනෝද්‍යා

කෘතියේ නම : පුංචි අහිංසා
ප්‍රථම මුද්‍රණය : 2024-12-21
කථාව සහ චිත්‍ර : සාවිකා නෙතුෂි විනෝද්‍යා
කතෘගේ ලිපිනය : අංක 374, දිගන, නව නගරය, රජවැල්ල
පාසල : මහාමායා බාළිකා විද්‍යාලය
ශ්‍රේණිය : 2 ශ්‍රේණිය B
පරිගණක අක්ෂර හා පිටු සැකසුම: AD House

# පෙරවදන

සාහිත්‍යය දියුණුව, රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍ය ම ය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසා ය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍ය ම ය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේ ම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාව ම ආදි කතෘ කරඳක අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩ නගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන "**හෙරණගත්කරණී**" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතර ම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන් ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමාන ය.


විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර.

## පිදුම


මගේ ආදරණීය මහාමායා බාලිකාවට
සහ පංතිභාර ගුරු මෑණියන්ට
මගේ පොත ගෞරවයෙන් පුදමි !



එක ගමක පුංචි ගෙදරක් තිබුණා.
ඒ ගෙදර හිටියේ අම්මයි දුවයි විතරයි.
එයාලා හරිම දුප්පත්.
ඒ දුවගේ නම අභිංසා.
එයා හරිම අහිංසක පොඩි ළමයෙක්.
එයාට හොඳට ඉගෙන ගන්න පුළුවන්.



ඉතින් එයාලා දුප්පත් නිසා සල්ලි තිබුණේ නෑ.
හරිම අමාරුවෙන් ජීවත් වුණේ.
එයාගේ අම්මට අසනීපයක් තිබුණා.
ඒ නිසා අහිංසාගේ අම්මා නිතර නිතර ලෙඩ වෙනවා.
හරියට බෙහෙත් කරන්නවත් සල්ලි තිබුණේ නෑ.



මේ නිසා පුංචි අහිංසා ඉස්කෝලේ ගියෙත් ඉඳලා හිටලා.
අහිංසාට හොඳට ඉගෙන ගන්න පුළුවන් නිසා,
එයා ඉස්කෝලේ ගියේ නැති වුණත් එයාට පුළුවන්
හැම වෙලාවෙ ම පොත් පාඩම් කරලා ඉගෙන ගත්තා.
ඒ නිසා එයාගේ ගුරුතුමිය අහිංසාට ගොඩාක් ආදරෙයි.



ඉතිං දවසක් අහිංසා වෙනදා වගේ ම නැගිටලා
උදේ ම ඉස්කෝලේ ගියා.
යාළුවොත් එක්ක සෙල්ලම් කළා.
පංතියේ උගන්වපු වැඩ ටික හොඳට කළා.
"අහිංසා හරිම හොඳයි..." කියලා ගුරුතුමිය කීවා.
ඊට පස්සේ පාසල ඇරිලා,
අහිංසා හරිම සතුටින් දුවගෙන ගෙදර ආවා.



"අනේ මම ඉස්කෝලේ ඇරිලා එනකොට
අම්මා බලාගෙන ඉන්නවනේ මම එනකල්...
අද අම්මා පේන්න නෑනේ... මොකද දන්නේ නෑ..."
කියලා අභිංසා හිතුවා.
"අම්මා... අම්මා..."
කියාගෙන අභිංසා ගෙට දුවගෙන ආවා.
අම්මට හොඳටම අමාරු වෙලා බිම වැටිලා හිටියා.




අහිංසා අඩ අඬා ම දුවගෙන අම්මා ළඟට ගියා.
"ඇයි අම්මා... ඔයාට මොකද...?"
කියලා ඇහුවා.
"මට ටිකක් අමාරුයි මගේ දුවේ..."
කීවා.
අහිංසා ඉක්මනට කුස්සියට ගිහින්
වතුර ටිකක් ගෙනත් අම්මාට පෙවුවා.



අම්මා, පුංචි අහිංසාව තුරුළු කරගෙන
"මගේ චූටි දුව හොඳට ඉගෙන ගන්න..."
කියලා අමාරුවෙන් ඔළුව අත ගෑවා.
අහිංසා තවත් අම්මාට තුරුළු වුනා.
"හා අම්මා... මම හොඳට ඉගෙන ගන්නම්..."
අඬ අඬා අහිංසා, අම්මාට කීවා.



අහිංසාගේ අම්මා, අහිංසාව දාලා යන්න ගියා. අහිංසා දන්නේ නෑ. අම්මා මිය ගියා කියලා. අහිංසා, අම්මාට තුරුළු වෙලා ම ආයෙමත් හයියෙන් කෑ ගහලා අඬන්න පටන් ගත්තා.



එතකොට අහළ පහළ අය ඔක්කොම
අහිංසා අඬන සද්දෙට ගෙදරට දුවගෙන ආවා.

"ඇයි ඇයි දුවේ... මොකද කෑගහන්නේ, ඇයි අඬන්නේ...?"
කියලා ඇහුවා.
"අම්මා කතා කරන්නේ නෑ..."
කියලා අහිංසා කීවා.
"හරි දුවේ... අඬන්න එපා... අපි බලමු..."
අහිංසාව තුරුළු කරගෙන කීවා.
හැමෝට ම හිතා ගන්න බැරි වුණා.
අහිංසාගේ අම්මා මිය ගියා කියලා.
ඔක්කෝ ම අහිංසාගේ අම්මාගේ
අවසන් කටයුතු වලට උදව් කළා.


අපි හොඳ ළමයි
වෙමු.

ඉතිං පුංචි අහිංසා ගමේ අයගේ උදව් ඇතිව
හොඳට ඉගෙන ගත්තා.
අහිංසා ලොකු වෙලා කරුණාවන්ත ගුරුතුමියක් වුණා.
එයා දුප්පත් ළමයින්ට ගොඩාක් උදව් කරගෙන
හොඳින් ජීවත් වුණා.





**සාචිකා නෙතුෂි විනෝදයා**
**2 ශ්‍රේණිය B**
**මහාමායා බාලිකා විද්‍යාලය, මහනුවර.**

# පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප් නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍යය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩ ව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතු ය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකි ය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන් ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේ ම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසඟ, සාහිත්‍යය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනෙවිරත්න මහලේකම්



978-624-208-222-6ISBN